# රබන් සුරල් විනිවිදීම්

ෂිතාරා රත්නායක

රබාන යනු සිංහල ජන සංගීතයේ ඉතා සුවිශේෂ අංගයක් ලෙස සැහෙන කලක සිට පැවත එන වාද්‍යය භාණ්ඩයකි. දීර්ග ඉතිහාසයක් රබාන සතුව පවතී. බක්මහ අසිරිය ලංවෙද්දි ගම් දනව් ඒ සතුටින් උදම්වේ. ගමේ පරිසරයට ජීවය ලබාදෙන්නේ රබන් හඬයි. එය සිංහල ජාතික ක්‍රීඩාවක් වශයෙන්ද විවිධ අංශ නියෝජනය කරයි. නමුත් එය අද අපගේ සංස්කෘතික අංග වලින් හා සමාජයෙන්ද නිලීනිව යන බවක් පෙනී යයි. එසේ නිලීන වන රබන් සුරල් හඬට නව ජීවයක් දෙමිනි 1999 වර්ෂයේ මංගල කේශව දිසානායක 'රබන් සුරල් හා සමාජය' කෘතිය රචනා කරයි. ඒ අනුව මෙහි රබන් සුරල් හඬ අතරේ රැව් දෙන විශ්‍රාන්ති රටා, හාස්‍ය රසය, සතුට විනෝදය, පරිසරයේ සෞන්දර්යය ඇතුලත්ය. රබානේ උපත සහ ව්‍යාප්තිය රබන් සුරල්වලින් පිලිබිඹු වන ආගමික චින්තනය , රබන්කරුවා දුටු පරිසරය සෞන්දර්යය රබන් සුරල් මතු කරන උපහාසය හා හාස්‍ය රබන් පදවලින් පිලිඹිබු වන විවාහය, ශෘංගාරය, විරහව ආදි සංකල්ප , රබන් සුරල් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන්, රබන් පදවලින් මතුවන ශබ්ද රසය ලෙස කොටස් 7කින් සමන්විත මෙම ග්‍රන්ථය පිටු 92කින් යුක්ත වන අතර ආශ්‍රිත ග්‍රන්ථද දක්වා ඇත.

කලාව, සාහිත්‍ය හා ක්‍රීඩා ආදියද සංස්කෘතිය හා බද්ධ වේ. ජාතික අනන්‍යතාවය විදහා දක්වන ජාතිත කෙළිසෙල්ලම් රාශියක්ද සෑම ජාතියකටම දායාදව පවතී.... ආගමික අවස්ථාවල හා ආගමික ක්‍රීඩාවලට සම්බන්ධ නිසා යාතු කර්ම ස්වරූපයකුත් රබන් ක්‍රීඩාව හා සම්බන්ධව පවතී. මීට අමතරව මංගල සම්මත අවස්ථාවල රබාන අත්‍යවශ්‍ය අංගයක් බවට පත්වූ බව නොරහසකි. .... මගුල් ගෙවල් විනෝදය පිණිසත් වෘත්තීමය වශයෙන්ද කණ්ඩායම් ලෙසින්ද රබන්කරුවන් මෙම සෙල්ලමෙහි නියුක්ත වු බව දක්වයි.... ජීවිති පරිඥානය උපදවාගෙන සුපසන් අවබෝධයෙන් ලාංකික ගැමි කලාකරුවන් රබන් සෙල්ලමෙහි නිමග්න වු බව පෙනේ. කෙසේ වෙතත් ලංකාව පුරාම රබාන ප්‍රධාන කලා ආරක ජාතික සෙල්ලමක් , සන්නිවේදන මාධ්‍යයක්.... ගීත වාදිත බොඳුනු උවසු උවැසියනට සිත්ගෙන වාසය කිරිමට යෙදිමට සුදුසු ක්‍රීඩාවක් නොවූවත් අත තබන පළමු වාරයේම තෙරුවන් සරන යන්නෙන් අකැප ක්‍රීඩාවට සමාව යදින්නාක් මෙනි. පරිසරයේ සුන්දරත්වයෙන් ආහ්ලාදයට පත් ගැමි රසවත්හු ස්වභාව සෞන්දර්යයේ ලාලිත්‍ය තුළින් සුන්දර හැඟුම් දූනවුහ. පරිසර ස්වභාව සොඳුරු බවින් නැවුම් හැගඳම් දූනවුහ. පරිසර ස්වභාව සොඳුරු බවින් නැවුම් හැගුම් ජනිතවූ කල ඉන් ලබන වින්දනයෙන් ඔවුහු මුසපත් වෙති. සමාජ සම්භන්ධතාවල යම් යම් දූර්වලතා ලක්ෂණ හාස්‍ය හා උපහාසයට ලක් කිරිමට රුසියෝ ගැමි ජනතාවෝය. ඔවුන්ගේ සියුම් හාස්‍ය හා උත්පාදක ශක්තිය සැබැවින්ම සිත්ගන්නා සුලුය. දිරවිම ඉතා අපහසුය. එහෙත් ඔවුන් ඉන් මහත් විනෝදයක් ලැබූ බව නම් පෙනේ.... රබන් සුරල් තුළින් ජනතාව සතුට, ආහ්ලාදය විඳි අයුරුද ප්‍රකාශ කෙරේ. ගාලු කොළඹ රබන් පදවල ස්වභාවයේ වෙසන අවබෝධ කර ගන්නා එම ශිල්පයෙහි ප්‍රවීණයෝ කොළඹ රබන් වැයුම හාස්‍යයට ලක් කරයි. ගැමි ළඳුන් ජීවිතයේ දූර්වලතා ඉතා හාස්‍යජනක ලෙස රබන් පද තුලින් නිර්මාණයවී එයි. මෙබඳු අයුරින් සමාජයේ විවිධ තත්ත්වයන් පැතිකඩ හාස්‍යයට හා උපහාසයට ලක් කිරිම හා සතුටක් ලැබිමට රබන් පදකරුවන් උත්සාහ දරනු ලැබු බව පෙනේ. මෙලෙස විවාහය, ශෘංගාරය විරහව ආදි විවිධ මානසික හා කායික තත්ත්වයන්ද රබන් පදවලින් ප්‍රචලිත වන අතර....

රබන් සුරල් හඬින් අප සැවොම ප්‍රීතිමත් සහ ප්‍රබෝධමත් කරවයි. ග්‍රාමීය ජනයා විනෝදය උදෙසා මෙන්ම තම කාංසිය සන්සිඳුවා ගැනීම උදෙසා ද රබන් සුරල් වාදනය කළේය. තවත් අවස්ථාවකදී ඔවුන් එය ක්‍රීඩාවක් ලෙසද සිදූ කළේය. රබන් සුරල් හා සමාජය කෘතිය මගින් රබන් වාදනය ක්‍රීඩාවක් වශයෙන් විනෝදකාමී අයුරින් භාවිතයට ගන්නා ආකාරයන් ගැන අධ්‍යයනයට මහත් රුකුලක් ලැබේ. ඒ තුළින් අතීත ජනයාගේ රබන් සුරල් මත පදනම් වූ විශ්‍රාන්ති රටාවන් පිලිබද අවබෝධයක් ලබාගැනිමට වැදගත්වේ.

මංගල කේෂව දිසානායක (1999) රබන් සුරල් හා සමාජය, (පළමු මුද්‍රණය), මුද්‍රණය චතුර මුද්‍රණාලය 142. අවිස්සාවේල්ල පාර, වැල්ලම්පිටිය.